# කොළඹ විශ්ව විද්‍යාලය
## නීති පීඨය
## නීතිවේදී උපාධි පරීක්ෂණය, තෙවන වසර - 2019
## සාක්ෂි හා නඩු විධාන නීතිය
## (පැ තුනයි)

මුළු ප්‍රශ්ණ සංඛ්‍යාව: 07

ඕනෑම ප්‍රශ්ණ **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

(අපැහැදිලි අත් අකුරු වලට ලකුණු අඩු කෙරේ)

---

(1) ඇණුම් තුවාල ගනනාවකින් පහර ලබා මරණයට පත්ව සිටි රාජා ඔහුගේ කොළඹ තට්ටු නිවාසයේ දී හමු විය. සාක්ෂි ආඥා පනතේ විධිවිධාන සහ නඩු තීන්දු ඇසුරින් පහත කාරණා අදාළ වන්නේද හෝ නොවේද යන්න සාකච්ජා කරන්න.

අ) රාජාගේ රියැදුරු සිල්වා පෙරකී අයගේ මරණයට සතියකට පෙර පිහියක් මිලදී ගත් අතර එය තව දුරටත් ඔහුගේ සන්තකයේ නොමැත.

ආ) රාජාගේ මරණය සිදුවූ දිනයේ රාජාගෙන් දුරස්ථව සිටි ඔහුගේ බිරිඳ වන කමණිව තමන් විසින් කතරගමට ගෙන ගිය බව සිල්වා කියා සිටී.

ඇ) මරණය සිදුවූ දිනයේ තමන් කතරගම සිටි බව පෙන්වීමට කතරගම තානායමකින් නිකුත් කළ රිසිට් පතක් කමණි සතුව ඇතත්, දුරකථන දත්ත සාක්ෂි වලට අනුව කමණිගේ ජංගම දුරකථනය මරණය සිදුවූ දින කතරගමදී භාවිතා කොට නොමැත.

ඈ) රාජාගේ මරණයට සති 3 ට පසුව ඔහුගේ ජීවිත රක්ෂණ ආවරණයෙන් රුපියල් මිලියන 15 ක මුදලක් කමණිට ලැබී ඇත. වසර 5 කට පෙර කමණිගේ පළමු විවාහයේ සැමියා සැක සහිත ලෙස ඔහුගේ පිහිනුම් තටාකයේ ගිලී මිය ගිය විට කමණිට රුපියල් මිලියන 10 ක රක්ෂණ මුදලක් ලැබී ඇත.

(2) මිනීමැරීමට සහ කොල්ලකෑමට ජයසිරි අභිචෝදනා ලබා ඇත. තමන් විසින් නිවසක් කොල්ලකෑ බවත් එම නිවෙස් හිමියාට පිහිඇනුම් තුවාල සිදු කළ බවත් පිළිගනිමින් මෙයට පෙර ජයසිරි විසින් මහේස්ත්‍රාත් වරයාට ප්‍රකාශයක් කොට ඇත. මෙම ප්‍රකාශය කිරීමේදී, මරණය සිදු කිරීමට තමන් විසින් භාවිතා කළ පිහිය සැඟවූ ස්ථානය ජයසිරි විසින් එළිදරව් කරන ලදී. එම පිහිය සහ ජයසිරි විසින් මහේස්ත්‍රාත්වරයාට කරන ලද ප්‍රකාශය සාක්ෂි ලෙස ඉදිරිපත් කිරීමට අභිචෝදක පාර්ශවය උත්සාහ කරයි. ජයසිරි කියා සිටින්නේ පොලිස් නිලධාරීන් මෙලෙස ප්‍රකාශ කළ බවයි: 'නිවෙස් හිමියාව මැරුවා කියා පිළිගන්න, එතකොට අපි තමාට යන්නට ඉඩ හරිනවා'. තවද ජයසිරි කියා සිටින්නේ මහේස්ත්‍රාත් විසින් තමාගේ ප්‍රකාශය සටහන් කරන අතරතුරේ පොලිස් නිලධාරීන් තමන් අසලින් සිට ගෙන සිටි බවයි.

සාක්ෂි ආඥා පනතේ අදාල වගන්ති සහ නඩු තීන්දු වලට අවධානය යොමු කරමින් අභිචෝදනාව සහ ජයසිරිගේ විත්තිවාචකය පදනම් කිරීමට අපේක්ෂිත සාක්ෂි වල ඇතුළත් කළ හැකි බව (admissibility) සාකච්ඡා කරන්න.

(3) අදාල නඩු තීන්දු සහ ව්‍යවස්ථාපිත අධිකාරීන් වලට අවධානය යොමු කරමින් පහත ප්‍රකාශයන් ගැන අදහස් දක්වන්න.

අ) ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත හරහා පොලිස් නිලධාරීන් විසින් සටහන් කර ගන්නා ලබන ප්‍රකාශ උසාවියේදී හරයාත්මක සාක්ෂි ලෙස ඇතුළත් කර ගැනීම (admissibility) සම්බන්ධ නීතියට ප්‍රබල වෙනස්කම් ඉදිරිපත් කර ඇත.

ආ) අනුසන්දනය (Corroboration) සම්බන්ධ නීතිය ඒකරූපී (uniform) නොවීමට හේතුවනම් ලිංගික වැරදි (sexual offences), අස්කරගන්නා ලද පාපොච්චාරණ, සම චූදිතයන්ගේ (co-accused) හෝ අපරාධ සහායකයාගේ (accomplice) සාක්ෂි වැනි වැරදි වල වර්ගය හෝ සාක්ෂි වල ස්වභාවය මත අනුසන්දනය කිරීමේ අවශ්‍යතාවය රඳා පැවතීමය.

(4) මව්ඩත් සහ චතුර යන අය මරණයට පත් කිරීම සම්බන්ධව කුමාර මිනීමැරුම් චෝදනා ලබා සිටියි. අපරාධය සිදුවූ ස්ථානයේදී එසැනම මව්ඩත් මිය ගිය අතර, සිද්ධියට පසුදින චතුර රෝහලේදී මිය ගියේය. මිය යාමට පෙර චතුර විසින් පහත සඳහන් ප්‍රකාශය පොලිසියට ලබා දුන්නේය: 'කුමාර මව්ඩත්ට කඩුවෙන් කෙටුවා. එතකොට මව්ඩත් ඇද වැටුනා. මම මව්ඩත්ව බේරා ගන්නට දුවගෙන යනකොට, කුමාර මං දිහාවට හැරිලා මටත් කඩුවෙන් කෙටුවා'. සාක්ෂි ආඥා පනතේ විධිවිධාන සහ නඩු තීන්දුවලට අවධානය යොමු කරමින් චතුර විසින් පොලිසියට කරන ලද ප්‍රකාශයේ ඇතුළත් කළ හැකි බව (admissibility) සාකච්ඡා කරන්න.

(5) A හෝ B යන ප්‍රශ්ණ **<u>දෙකෙන් එකකට පමණක්</u>** පිළිතුරු ලියන්න.

(A) සාක්ෂි ආඥා පනතේ විධිවිධාන සහ නඩු තීන්දුවලට අවධානය යොමු කරමින් පහත අවස්ථාවන් සාකච්ඡා කරන්න.

> අ) හෙරොයින් ග්‍රෑම් 6 ක් සන්තකයේ තබා ගැනීම සම්බන්ධව ඩේවිඩ් චෝදනා ලබා ඇත. මෙයට පෙර චූදිත මත්ද්‍රව්‍ය ප්‍රවාහණය කිරීමට සම්බන්ධ වූ අවස්ථා 2 ක් පිළිබඳව නඩු විභාගය අතරතුරදී අභිචෝදක පාර්ශවය චූදිතගෙන් ප්‍රශ්ණ කළේය. මෙම ප්‍රශ්ණ වලට චූදිතගේ පාර්ශවයෙන් විරෝධතා නොදැක්වූ අතර පෙර මත්ද්‍රව්‍ය සම්බන්ධ සිදුවීම් නඩු වාර්තා වලට ඇතුළත් වීමට ඉඩ ලැබුනි.
>
> ආ) රේමන්ඩ් පරිඝනක ග්‍රැෆික් තාක්ෂණවේදියෙකි. ඊජිප්තුවේ පුරාණ මමී මෘතදේහ තැන්පත් කළ ස්ථානයක පුරාවිද්‍යාඥයන් සහ වෝහාරික විද්‍යාඥයන්ගෙන් (forensic scientists) සමන්විත කණ්ඩායමක් සමඟ ඔහු වසර 5 ක කාලයක් වැඩ කොට ඇති අතර ඔහුගේ කාර්යය වූයේ පරිඝනක ග්‍රැෆික් යොදා ගනිමින් මමීන්ගේ මුහුනු ප්‍රතිනිර්මාණය කිරීමය. තමන් විසින් ඊජිප්තුවේදී භාවිතා කරන ලද පරිඝනක මෘදුකාංග (computer software) යොදා ගනිමින් වින්දිතයාගේ මුහුන පරිඝනක ග්‍රැෆික් ආශ්‍රයෙන් ප්‍රතිනිර්මාණය කිරීමෙන් දිරාගිය මෘත ශරීරය හඳුනා ගැනීමට ඔහු ලංකාවේ පොලිස් කණ්ඩායමට සහාය විය.

නැත්හොත්

(B)

අ) 'අභිචෝදක පාර්ශවයේ ඔප්පු කිරීමේ භාරය කිසිවිටෙක චූදිතයා වෙත මාරු නොවෙන අතර, තමන්ගේ නිර්දෝෂීබව ඔප්පු කිරීමට හෝ තම විත්තිවාචකය උදෙසා සාක්ෂි ගෙන හැර පෑමට හෝ ප්‍රකාශයක් කිරීමට හෝ ඔහු කිසිඳු වගකීමකින් බැඳී නොමැත්තේය'. සාක්ෂි ආඥා පනතේ විධිවිධාන සහ නඩු තීන්දුවලට අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය විමසන්න.

ආ) සාක්ෂි ආඥා පනතේ 114 වගන්තිය මෙසේ දක්වයි: 'විශේෂිත අවස්ථාවේ සිද්ධිවලට අදාළව ස්වාභාවික සිදුවීම් වල සාමාන්‍ය පිළිවෙළ ද, මිනිස් ගති පැවතුම ද, පොදු හා පුද්ගලික වැඩ කටයුතු ද ගැන සැළකිල්ලක් දක්වමින් සිදුවී තිබීමට ඉඩ ඇතැයි අධිකරණය අදහස් කරන යම් සිද්ධියක පැවැත්ම අධිකරණය විසින් පූර්ව නිගමනය කළ හැකිය.' සාක්ෂි ආඥා පනතේ විධිවිධාන සහ නඩු තීන්දුවලට අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය සාකච්ඡාවට ලක් කරන්න.

(6) 'ඇප ලබා ගැනීම සම්බන්ධව පුරුවැසියන් භුක්ති විඳි අයිතිවාසිකම් 1997 අංක 30 දරණ ඇප පනත මගින් සීමාවට ලක් කොට ඇති බවට චෝදනා නැගෙයි. "මෙහි මින් මතු සළසා ඇති විධිවිධාන වලට යටත්ව" යන යෙදුම පනතට එක් කිරීමෙන්, ඇප ලැබිය හැකි වරදකට ඇප ලබා දීම මේ වනවිට පනත මගින් සීමා කොට ඇත'. ඔබ මේ ප්‍රකාශයට එකඟ වන්නේද? අදාල අධිකාරීන්ගේ (authorities) සහාය ඇතිව ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.

(7) වරෙන්තුවක් රහිතව සාම නිලධාරියෙකු විසින් ශ්‍රී ලංකාව තුළදී යම් පුද්ගලයෙකුව අත් අඩංගුවට ගත හැක්කේ කුමන අවස්ථාවකදී ද? එවන් අවස්ථාවක අත්අඩංගුවට ගැනීම සිදුකරන නිලධාරියා කටයුතු කරනු ලැබුවේ අත් අඩංගුවට ලක් වන පුද්ගලයාගේ ක්‍රියාකාරකම් සම්න්ධව ඇති කරගනු ලබන සාධාරණ සැකයක් මතය යන අවශ්‍යතාවය සපුරන්නේ කෙසේද? අදාල නඩු තීන්දු සහ ව්‍යවස්ථාපිත අධිකාරීන් වෙත අවධානය යොමු කරමින් ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.

********